# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

**පුරප්පාඩු**

***"ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ කොටස්කරුවකු වීමට එක්වන්න"***

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා**
**පුරප්පාඩු ගණන - 05**

**1.1 සුදුසුකම්**

**1.1.1 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

**1** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**2** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (PhD)

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

අධ්‍යාපනවේදී උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**1.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1, 2 හෝ 3)**

**1** ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.

**2** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශේෂවේදී/සාමාන්‍ය උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

සහ

"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයේ (AR1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ජීව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශේෂවේදී/සාමාන්‍ය උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම

සහ

"අධ්‍යයන/පර්යේෂණ" සේවා ගණයේ (AR1) තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**1.2** **වැටුප් කාණ්ඩය** - (AR 2)

**1.3** **වැටුප් පරිමාණය** - AR 2-2016-76,200-10x2,000-96,200/-

මාසික ජීවන වියදම් දීමනාව : රු.7,800/-
මාසික දුරකතන දීමනාව : රු.4,000/-
මාසික වෘත්තීය දීමනාව : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව
පර්යේෂණ දීමනා : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව
වාහන බලපත්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව

**1.4** **වයස** - අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට, වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

## 02. තනතුරු නාමය - ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී

**සේවා ගණය - අධ්‍යයන හා පර්යේෂණ සේවා**

**පුරප්පාඩු ගණන - 02**

**2.1 සුදුසුකම්**

**2.1.1** බාහිර අයදුම්කරුවන්

(අ) 1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් පළමු පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ) සාමාර්ථයක් සහිතව සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙවන පන්තිය (පහළ) සාමාර්ථයක් සහිතව සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම සහ එක් අවුරුදු පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් වී තිබීම.

හෝ

3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් සහ දෑඅවුරුදු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම.

(ආ) 1 පර්යේෂණ සහ සමීක්ෂණ ඉටු කිරීම පිළිබඳව ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත. ක්ෂේත්‍රයට අදාළව ඉටුකර ඇති අධ්‍යාපන, පර්යේෂණ හා සමීක්ෂණ සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**2.1.2** අභ්‍යන්තර අයදුම්කරුවන්

1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම.

සහ

3 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වැඩසටහන් නිලධාරි (ප්‍රතිපත්ති/සැලසුම්) (MA4) තනතුරේ II ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.2** වැටුප් කාණ්ඩය - (AR 1)

**2.3** වැටුප් පරිමාණය - AR 1-2016-53,150-1,375x10-1,910x15-95,550/-

මාසික ජීවන වියදම් දීමනාව : රු.7,800/-
මාසික දුරකතන දීමනාව : රු.2,500/-
මාසික වෘත්තීය දීමනාව : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව
පර්යේෂණ දීමනා : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 අනුව
වාහන බලපත්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව

**2.4** වයස - අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට, වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03.** තනතුරු නාමය **- වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)**
**වැඩසටහන් නිලධාරී (මුදල්)**

**සේවා ගණය - ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවාවන්**

**පුරප්පාඩු ගණන - වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) - 02**
**වැඩසටහන් නිලධාරී (මුදල්) - 01**

**3.1 සුදුසුකම්**

**3.1.1** බාහිර අයදුම්කරුවන්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන විද්‍යාව, කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

(ආ) **අතිරේක සුදුසුකම් -**වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) තනතුර සඳහා

(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද
(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා වන පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද

**3.1.2** අභ්‍යන්තර අයදුම්කරුවන්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී (MA 1) I වන ශ්‍රේණියේ අවුරුදු 10කට වැඩි සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින්

**3.2** වැටුප් කාණ්ඩය - (MA-4)

**3.3** වැටුප් පරිමාණය - MA 4-2016 -37,910-755x10-930x15-1,135x5-65,145/-
මාසික ජීවන වියදම් දීමනාව : රු.7,800/-

**3.4** වයස - අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට, අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**4. අවශ්‍ය වෙනත් සුදුසුකම්:**

සෑම අයදුම්කරුවෙක් ම,

**4.1** ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

**4.2** තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය, කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**4.3** විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**4.4** ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට හැකිවීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**5. තෝරා ගැනීමේ ක්‍රමවේදය**

සුදුසුකම් හා පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් හා/හෝ ලිඛිත විභාගයක් සඳහා කැඳවනු ලැබේ.

**6. පත්වීමේ ස්වභාවය**

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය.

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

**nec.gov.lk යන ආයතනික වෙබ් පිටුවේ "පුවත් සහ සිද්ධි"** යටතේ ඇති ආදර්ශ අයදුම්පත අනුව සියලු ම විස්තර ඇතුළත් කර සකසන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත් ද සමග **2020 නොවැම්බර් 10** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් රැගෙනවිත් භාර දිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත ඔවුන්ගේ ආයතන ප්‍රධානී මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
නො.126, නාවල පාර, නුගේගොඩ